# පුරාණ ශ්‍රී ලංකාවේ ශ්‍රී පාදස්ථානය තෙක් විහිදුණු ගමන් මාර්ග පිළිබඳ අධ්‍යයනයක්

එම්. ඒ. ප්‍රසාද් කුමාර[1]

**සංක්ෂේපය**

රජරට රාජධානියෙහි සිට ශ්‍රී පාදස්ථානය දක්වා විහිදී ගිය ගමන් මාර්ග පිළිබඳ ව සාහිත්‍ය හා අභිලේඛන මූලාශ්‍රය ඇසුරින් පුළුල්ව සාකච්ඡා කිරීම මෙම අධ්‍යයනයෙන් සිදු කෙරේ. ප්‍රස්තුතය සම්බන්ධයෙන් තොරතුරු ඇතුළත් සාහිත්‍ය හා පුරාවිද්‍යාත්මක මූලාශ්‍රය හඳුනාගැනීම, ඒවා සියුම්ව අධ්‍යයනය කිරීම, පුරාණ මාර්ග පද්ධතිය, එහි ස්වභාවය සහ වර්තමාන තත්ත්වය හඳුනාගැනීම මෙම පර්යේෂණයේ අරමුණු විය. මේ සඳහා අවශ්‍ය දත්ත ලබා ගැනීමේ දී ප්‍රාථමික හා ද්විතීයික මූලාශ්‍රය යොදාගත් අතර මාර්ග පද්ධතිය පිළිබඳ ව ක්ෂේත්‍ර අධ්‍යයන ඔස්සේ තොරතුරු ලබාගැනීම සිදුවිය. රජරට රාජධානියේ සිට සමනොළ ගිර දක්වා විහිදුනු මාර්ග 03ක් පුරාණයේ සිට පැවත තිබේ. රත්නපුරයේ සිට ගිලිමලේ හරහා මාර්ගය, කෙහෙල්ගමුවේ සිට විහිද ගිය මාර්ගය, නැගෙනහිර සිට ඌව හරහා විහිද ගිය මාර්ගය එම මාර්ග 03යි. 1වන විජයබාහු රජු ශ්‍රී පාදයට යන මෙම මාර්ග ප්‍රතිසංස්කරණය කළ බවට එන මහාවංශ පුවත අඹගමුව ශිලා ලිපියෙන් හෙළිදරව් වී ඇත. නිශ්ශංකමල්ල රජු (ක්‍රි.ව. 1187-1196) ශ්‍රී පාදය වැඳපුදාගැනීමට ගිය බව අභිලේඛනවල දැක්වේ." සමනොළ යන මඟ ජල දුර්ග, වන දුර්ගයන් අති දුර්ගය පින් ලෝභයෙන් අවුරුදු පතා යන අෂ්ටාදේශවාසි සත්ත්ත්වයෝ බොහෝ පීඩා විඳිනාහ" යනුවෙන් කල්පනා කළ දෙවන පරාක්‍රමබාහු රජු එම මාර්ගය පිළිසකර කිරීමට දේව ප්‍රතිරාජ ඇමතියා යැවූ බව මහාවංශය දක්වයි ක්‍රි.ව. 1340 දී ලංකාවට පැමිණි ඉබන් බතූතා 'බබා පාර' හා 'මමා පාර' යනුවෙන් ශ්‍රී පාදයට නැගිය හැකි මාර්ග දෙකක් දක්වා ඇත. ආදම්ගේ පාර සහ ඒවගේ පාර යන අරුත එහි ඇත. මේ අනුව පුරාණ ලංකාවේ ශ්‍රී පාදය තෙක් විහිදුනු මාර්ග රැසක තොරතුරු හෙළිදරව් වන බව පැහැදිලිය. එහෙත් වර්තමානය වන විට ප්‍රධාන මාර්ග දෙකක් හැර සෙසු මාර්ග උපයෝගිතාවයෙන් දුරස් ව ඇත.

***මුඛ්‍ය පද:*** *අභිලේඛන, ඉබන් බතූතා, දුර්ග, බබා පාර, මමා පාර, සමනොළ*

[1] සහය කථිකාචාර්ය, මානවශාස්ත්‍ර අධ්‍යයන අංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය

prasadmallawaarachchi85@gmail.com

**හැඳින්වීම**

බුදුන් වහන්සේගේ තෙවනවර ලංකාගමනයත් සමඟ ඓතිහාසික වැදගත්කමක් උරුමකරගත් ශ්‍රී පාදස්ථානය සමන් දෙවියන්ගේ අඩවිය වශයෙන් හඳුන්වනු ලැබේ. සුමන සමන් දෙවියන්ගේ ආරාධනාවෙන් බුදුන් වහන්සේ විසින් උතුම් වූ වම් ශ්‍රීපතුල සමනොල ගිර මත පිහිට වූ නිසා බෞද්ධ බැතිමතුන්ගේ නොමඳ වන්දනාවට පාත්‍ර වී ඇත. එමෙන්ම ඉස්ලාම්, හින්දු ආදී විවිධ ආගමිකයෝ ද තමන්ගේ ශාස්තෲවරයාගේ පා සටහන යැයි සිතා ශ්‍රීපාදය වන්දනා කරති. මෙලෙස වැදගත්කමක් හිමිකර ගත් ශ්‍රීපාදස්ථානය තරණය කිරීම සඳහා අතීතයේ සිට භාවිත වූ ගමන් මාර්ග හා ඒවායේ ඓතිහාසිකත්වය, වර්තමාන තත්ත්වය පිළිබඳව විමර්ශනාත්මක අධ්‍යයනයක් මෙහිදී සිදු කෙරේ.

**ක්‍රමවේදය**

මෙම අධ්‍යයනය සිදු කිරීමේදී මූලික වශයෙන් පුස්තකාල පරිශීලනය කරන ලද අතර ඒ යටතේ ප්‍රස්තුතයට අදාළව මෙතෙක් පළවී ඇති ප්‍රාථමික හා ද්විතීයික මූලාශ්‍රය විමර්ශනයට ලක් කෙරිණි. තත් මාර්ගයන්හි වර්තමාන තත්ත්වය අධ්‍යයනය කිරීම පිණිස වත්මන් ලේඛකයා විසින් 2017.02.22 දින ශ්‍රීපාදය තරණය කරන ලදී. මෙම සියලු දත්ත පදනම් කොට ගනිමින් ප්‍රස්තුතය විචාරාත්මක ප්‍රවේශයකින් සාකච්ඡාවට බඳුන් කිරීම මෙහි ක්‍රමවේදය වෙයි.

**විමර්ශනය**

ශ්‍රීපාදස්ථානය තරණය කරන බැතිමතුන් හට එකී කාර්යය වෙනුවෙන් ප්‍රධාන මාර්ග දෙකක් හා එම මාර්ග පද්ධතිවලට සම්බන්ධ වන අතුරු මාර්ග 05 ක් හඳුනාගත හැකිය. ශ්‍රීපාදස්ථානයට ළඟා විය හැකි ප්‍රධාන මාර්ග වන්නේ පලාබද්ගල මාර්ගය හා මස්කෙළිය - නල්ලතන්නිය මාර්ගයයි. අතුරු මාර්ග වශයෙන් කුරුවිට මාර්ගය, දැරණියගල මාලිබොඩ මාර්ගය, මුක්කුවත්ත මාර්ගය, ගවරවිල හා මරේවත්ත මාර්ගය හඳුනාගත හැකිය. ප්‍රධාන මාර්ග ද්විත්වය එකක් නුවරඑළිය දිස්ත්‍රික්කයෙනුත්, අනෙක රත්නපුර දිස්ත්‍රිකයෙනුත් ආරම්භවේ.

**ශ්‍රීපාදස්ථානයට යොමු විය හැකි ප්‍රධාන මාර්ග**

***පලාබද්ගල මාර්ගය***

සබරගමුව පළාතේ රත්නපුර දිස්ත්‍රික්කය පදනම් කර ගනිමින් සමනලගිර තරණය කරන බැතිමතුන් හට ගමන් කළ හැකි ප්‍රධානම මාර්ගය පලාබද්ගල මාර්ගයයි. පලාබද්ගල යන ග්‍රාම නාමය හා මාර්ගයට එම නම ව්‍යවහාරකිරීමට බලපෑ ඓතිහාසික වෘතාන්තයක් ඉතිහාසයෙන් සොයාගත හැකිය. " බත්මුලක්" වැනි ගලක් අසළ පිහිටීම නිසා "පටහත්ථසේල" යනුවෙන් පටබැඳුණු අතර එය පසුකාලීන ව්‍යවහාරයේ දී පලාබත්දල, පලාබත්ගල ලෙසින් භාවිතයේ පහසුව සඳහා සැකසී ඇත. (ඥාණවිමල 1942 : 36) එක්තරා කාන්තාවක් සිරිපා වඳින්නට යෑමට සැරසෙන කල්හි ඇයට ආහාර වේලට කිසි දෙයක් සපයාගත නොහැකි වූ තැන පලාමැල්ලුමක් සමඟ බත් මුලක් ගෙන යෑමට තීරණය කර තිබේ. මෙකී පලා සහිත බත්මුල දොළක් අසළට වී භුක්ති විඳීමට සූදානම් වන විට එකී බත්මුල රසවත් ව්‍යංජනයක් සහිත වූ බව ජනප්‍රවාදයේ එයි. (කරුණාදාස 2007 : 44) ඒ අයුරින් පලාබත්දොළ, පලාබත්ගල ලෙසින් ව්‍යවහාරයට නැගුණු බවට විශ්වාසයක් පැරැන්නෝ අතර වෙති.

මේ අනුව ජනප්‍රවාද පදනම් කර ගනිමින් හඳුනාගත හැකි පලාබත්ගල මාර්ගය පිළිබඳව මූලාශ්‍රයගත තොරතුරු ද විරල නොවේ. දේශීය සාහිත්‍ය මූලාශ්‍රයවල මෙන්ම විදේශීය සාහිත්‍ය මූලාශ්‍රයවල ද පලාබද්ගල මාර්ගය පිළිබඳව ගෙන එන සටහන් එහි ඓතිහාසිකත්වය හඳුනාගැනීමට ඉවහල් වෙයි. මහාවංශයේ ද්විතීයික භාගයේ පලාබද්ගල මාර්ගය හඳුන්වා ඇත්තේ "දුග්ගමජ්ජ" යන නමිනි. (මහාවංශය 1996:19-20 ගාථා) එහි අර්ථය නම් අසීරු වූ මාර්ගය, දුෂ්කර වූ මාර්ගය යන අර්ථයයි. ක්‍රි.ව 1344 දී පමණ ලංකාවේ දේශගවේෂණය කළ ඉබන්බතුතා ශ්‍රීපාදය වන්දනාමාන කළ අතර ඔහු එහිදී භාවිතා කළ මාර්ගය පලාබද්දල විය. ඔහු මෙම මාර්ගය "බබාපාර"යනුවෙන් හඳුන්වා ඇති අතර එය

ආදම්ගේ මාර්ගය වශයෙන් දක්වමින් එහි ඇති දුෂ්කරතාවය පිළිබඳව වැඩිදුරටත් සඳහන් කර තිබේ. (Bathuta 1999 : 51)

එමෙන්ම ජෝන්ඩේවි විසින් ද ශ්‍රීපාදය තරණය කිරීමේදී පලාබද්ගල මාර්ගය භාවිතා කළ බව ඔහුගේ කෘතියක සඳහන් වී ඇත. ජෝන් ඩේවි තම කෘතියේ දක්වන ආකාරයට පලාබද්ගල මාර්ගය ස්වභාව සෞන්දර්යය අතින් වැදගත්කමක් හිමිකර ගත් දුෂ්කර මාර්ගයක් බවත්, මිනිසුන් විශාල සංඛ්‍යාවක් එය භාවිත කළ බව සඳහන් කර ඇත.

"සමනොළ කරා යන මාවතේ අන්තිම ජනාවාස ස්ථානය පලාබද්ගලයි. කුඩා විහාරයක් ද එළිමහන් අම්බලන් දෙකක් ද මෙහි තිබේ. අපි කුඩා අම්බලමේ ලැගුම් ගතිමු සෑහෙන තරම් ලොකු අනෙක් අම්බලමේ සමනොළ කරා යන හෝ ඉන් බසින ස්ත්‍රී උභය පක්ෂයටම අයත් වන්දනාකාරයින් 200කට අධික සංඛ්‍යාවක් රැඳී සිටියහ. (තෙන්නකෝන් 1967 : 176)

ඉහත දැක්වෙන ප්‍රකාශය අනුව අතීත ලංකාවේ සිරිපා ගමන් සඳහා පලාබද්ගල මාර්ගය සාමාන්‍ය ජනයා පවා වැඩි වශයෙන් භාවිත කළ බවක්, අසන්නට ලැබෙන නිසා සමකාලීන සමය පිළිබඳව මනා අවබෝධයක් ලබාගත හැකිය. "බ්‍රෝහියර් දුටු ලංකාව" නම් කෘතියේ ද සිරිපා තරණය කිරීමේදී පලාබත්ගල මාර්ගය භාවිතා කළ ආකාරය පිළිබඳව තොරතුරු සඳහන් කර තිබේ. ඔහු පලාබත්ගල මාර්ගය පිළිබඳව කරන ලද විස්තරයේදී එම මාර්ගයේ ස්වභාවය පිළිබඳව දක්වා ඇත්තේ මෙසේය.

"1886 මාර්තු 17 දා රත්නපුරයෙන් පිටත් වීමු. අපගේ අදහස වූයේ ගිලීමලේ පාර ඔස්සේ ශ්‍රීපාදයට යාමයි. මාර්තු 18 ගිලීමලෙන් හිමිදිරියේ 5.45 ට පිටත් වීමු. 7.30 ට පලාබද්ගලට ළඟා වීමු මෙය සැතපුම් 03 පමණ දුරකි. මේ මාර්ගයේදී අපට අතුරිලය හා මස්කෙළිය කඳු තරණය කරන්නට සිදුවිය" (හේවාවසම් 1999:335)

යනුවෙන් දැක්වූ සඳහන අනුව පලාබද්ගල මාර්ගය ගිලීමලේ හරහා වැටී තිබුණු බවත්, ගිලීමලේ සිට සැතපුම් 03 ක් ගිය පසු පලාබත්ගල මාර්ගය හමුවූ බවත් සඳහන් වන නිසා පලාබද්ගල මාර්ගයේ මුල්කාලීන ස්වභාවය සැකසී තිබූ අන්දම මනාව හඳුනාගත හැකිය.

එමෙන්ම සිරිපා තරණය කළ රාජකීය වෛද්‍යවරයකු පිළිබඳව තොරතුරු නූතන කෘතියක සඳහන්ව තිබේ. එහි දැක්වෙන ආකාරයට දොස්තර වයිටර් හොස්මිස්ටර් නැමැත්තා ශ්‍රීපාද තරණය කිරීමේදී යොදාගත් මාර්ගය වූයේ පලාබද්ගල මාර්ගයයි. ශ්‍රී පාදය බලා රත්නපුරයෙන් ගමන් ඇරඹූ ඔහු පලාබත්ගල මාර්ගය ආරම්භ වන තැන ගිමන් හැර කිසිදු අපහසුතාවයක් නොදක්වා සිරිපා තරණය කළ බව සඳහන් කර තිබේ. (හේමපාල 2005 :173)

විදේශිය සංචාරකයන් පමණක්ම නොව දේශිය රජවරුන් පවා උතුම් වූ ශ්‍රීපාදය තරණය කිරීම සිදුකර ඇති අතර එම අවස්ථා පිළිබඳව අභිලේඛන මූලාශ්‍රය තුළින් තොරතුරු අනාවරණය වී තිබේ. පොළොන්නරු රාජධානියේ ආරම්භක පාලකයා වූ විජයබාහු රජු ශ්‍රීපාදය තරණය කිරීම සඳහා පලාබත්ගල මාර්ගය භාවිත කර ඇති බව ගිලීමලේ ශිලා ලිපිය සාක්ෂ්‍ය සපයයි. ගිලීමලේ ලිපිය දක්වන ආකාරයට විජයබාහු රජු විසින් සමනලගිර තරණය කරන සාමාන්‍ය ජනතාව වෙනුවෙන් ගිලීමලය හා බඹරකොටුව යන ගම්වර පූජා කිරීමක් සිදු කර ඇත. පොළොන්නරු පාලක නිශ්ශංකමල්ල රජු පලාබත්ගල මාර්ගය හරහා ශ්‍රී පාදය තරණය කිරීම සිදුකර ඇති බව මහාවංශය හා ජනප්‍රවාදගත තොරතුරු වේ. පලාබත්ගල මාර්ගය හරහා ශ්‍රී පාදය තරණය කරන සාමාන්‍ය ජනයාට මාළිගාතැන්න ප්‍රදේශයේදී රජ මාළිගයක් දැකිය හැකිවිය. වර්තමානයේදී එය දැකීමට නොහැකි වුවත් මූලාශ්‍රයවල දැක්වෙන ආකාරයට එහි පැවති රජමාළිගය නිශ්ශංකමල්ල විසින් කරවන ලද්දක් බව අනාවරණය වී තිබේ. සිංහලයේ අවසාන රජු වන ශ්‍රී වීර පරාක්‍රම නරේන්ද්‍රසිංහ රජතුමා ද ශ්‍රීපාදය තරණය කිරීම සඳහා පලාබත්ගල මාර්ගය තෝරාගත් බවට සාධක ලැබෙන අතර ගිලීමලේ ඇති වලව්ව ඔහුගේ වන බවට සාක්ෂ්‍ය සහිතව තොරතුරු අනාවරණය වී තිබේ. මේ අනුව පැහැදිලි වන්නේ අතීත රජවරුන් පවා ශ්‍රීපාදය වන්දනාමාන කිරීම නොපැකිළව සිදුකළ බවත් එකී අවශ්‍යතාවයේදී පලාබද්ගල මාර්ගය

සිය කැමැත්තෙන්ම තෝරාගත් බවත්ය. බොහෝ රජවරුන් මෙම මාර්ගය ශ්‍රීපාද තරණය සඳහා භාවිත කිරීම නිසා පසුකාලීනව එය ජනතාව විසින් "රජමාවත" ලෙසින් හැඳින්වීම පවා සිදුකොට තිබේ.

පලාබත්ගල මාර්ගයෙන් ගමන් අරඹන විට මුලින්ම හමුවන්නේ පලාබත්ගල රජමහා විහාරයයි. කීර්ති ශ්‍රී රාජසිංහ රජු විසින් නිර්මාණය කළ මෙහි පිළිමගෙයක්, දාගැබක්, බෝධියක් හා සංඝාවාසයකින් යුක්තව පිහිටා ඇත. විශේෂයෙන් ශ්‍රීපාදය ආවරණය කර තිබූ තඹ සිරිපතුල ද අඩි 03 ක් පමණ උස කිරිගරුඬ බුදුපිළිමය ද සිරස්පත සහිත අඩි 03 ක් උස හිටි පිළිමයක් ද දැක ගැනීමට ලැබේ. මෙම විහාරයට ආසන්නයෙන් පලාබත්ගල ආරණ්‍ය සේනාසනය පිහිටා ඇති අතර එහි ඉතිහාසය දඹදෙණි යුගය දක්වා දිවයයි. මෙය දෙවන පරාක්‍රමබාහු රජු විසින් දේව ප්‍රතිරාජ ඇමතියාගේ මූලිකත්වයෙන් නිර්මිත බව මූලාශ්‍රය සාධක වේ. (මහාවංශය, ද්විතිය භාගය 1996: 23-28 ගාථා)

"පසුව රජ තෙමේ ග්‍රාමාරණ්‍යවාසී වූ මහා සංඝයා රැස් කොට..... ඒ සියල්ලන් පලාබත්ගල රැස් කරවා ආරණ්‍ය වාසයක් කරවා උන් වහන්සේලාට දී උපස්ථාන කළේ යි... ඉක්බිති මේ විෂයෙහි ආගම්ධර ස්ථවිරයෝ තුනී යයි සියලුම පොත් දඹදිවින් ගෙන්වා...."

මෙසේ දේව ප්‍රතිරාජ විසින් සකසන ලද ආරණ්‍යය, පිරිවෙනක් ලෙසින් ද ප්‍රසිද්ධියට පත් වූ අතර දේවප්‍රතිරාජ පිරිවෙන නමින් වර්තමානයේ හැඳින්වේ. සාහිත්‍ය සුපෝෂණයෙහි ලා මහඟු මෙහෙවරක් ඉටු කරන ලද වේදේහ හිමියෝ මෙහි වැඩ වාසය කළ අතර උන්වහන්සේ විසින් සිදත් සඟරාව, රසවාහිනිය, සමන්තකූට වර්ණනාව ආදී කෘති රැසක් රචනා කර ඇත. වර්තමානය වන විට මෙම පිරිවෙන සජීවීව දැක ගැනීමට අවකාශය නොලැබුන ද එහි ගල්කණු ස්වල්පයක් පමණක් නෂ්ටාවශේෂව පවතින අයුරු දැකිය හැකිය. දේවප්‍රතිරාජ පිරිවෙන පසු කරනවිට ලිහිණිහෙළ හමුවේ. ලිහිණිහෙළ "නීලිහෙල" නමින් ද හැඳින්වේ. නීලි නැමැති කාන්තාව හෙළට වැටී මිය ගිය පුවතක් ඊට හේතු වූ ජනප්‍රවාදයයි. බ්‍රෝහියර් සිය වාර්තාව තුළ ලියනිහෙළ, ලිහිණිහෙළ වශයෙන් ලිහිණිහෙළ පිළිබඳව දක්වා ඇති අතර මෙහි කුඩා තැනිතලාවක අම්බලමක් ද පිහිටා තිබූ බව සඳහන් කර ඇත. (හේවාවසම් 1999:335)

ලිහිණිහෙළ පසුකරන විට කටුකිතුල වංගුව හා ගෝනතල්ල තරණය කිරීමට මිනිසුන්ට සිදුවන අතර ඉන්පසුව ගෙත්තම්පාන හමුවේ. එමෙන්ම ගජමංසල අම්බලම ද සුවිශේෂී ස්ථානයකි. මෙය දියබෙත්ම අම්බලම වශයෙන්ද හැඳින්වෙන අතර කළුගඟෙහි උපත එම ස්ථානයේදී සිදුවීම ඊට හේතු වී තිබේ. මාතර යුගයේ කිවිඳියක් වූ ගජමන් නෝනා ශ්‍රීපාද වන්දනාව සිදුකරන විට ඇයගේ නවාතැන් ගැනීම පිණිස මෙම අම්බලම නිර්මාණය වූ බවත්, එහිදී ගජමන් නෝනාගේ අම්බලම වූ බවත් ජනප්‍රවාදගත පුවතකි.

පලාබත්ගල මාර්ගය තුළ දැකිය හැකි වැදගත් හා ඓතිහාසික ස්ථානයක් ලෙස "ධර්මරාජගල" සැළකේ. ජෝන් ඩේවි ශ්‍රීපාදය පිළිබඳව සඳහන් කරන තැන එහි ඇති ශිලා ලිපියක් පිළිබඳ වාර්තාවක් සපයා ඇත.

"ගලේ පඩි කපා තිබුණු හෙයින් නැග්මේ අනතුර සම්පූර්ණයෙන්ම පහව තිබුණි. ගල්පඩි පේළි 04 ක් මගින් අපි සුවසේ ඉහළට නැග්ගෙමු. ... ගලේ හරි අඩක් පමණ ඉහළින් වම් පැත්තේ දළ ලෙස කැටයම් කරන ලද මිනිස් රුවක් ද, සිංහල සෙල්ලිපියක් ද වේ. (තෙන්නකෝන් 1967 : 110-111)

එමෙන්ම ධර්මරාජගල පිළිබඳව සඳහන්වන තවත් වාර්තාවකට අනුව ධර්මරාජ නම් තාපසයා මේ ප්‍රදේශයේ ජීවත්ව සිටි බවත්, වේදවනප්පෙරුමාල් නැමැති ආරච්චිගේ උදව් ඇතිව මෙම පියගැටපෙළ කරවූ බවත් සඳහන් වේ.

"....... කසාවතු නම් බමුණුගම ගිරිමහලා නම් බ්‍රාහ්මණ වංශයෙහි උපන්..... තාපසයන් බුදුබව පතා වේදවනප්පෙරුමාලා නම් වූ තවත්.ඝාඝා ආරච්චිගේ සහායෙන් කෙට වූ පියගැට මාලාවයි" (රත්නපාල 1996:28)

ධර්මරාජගල පිළිබඳව ජනවහරේ පවතින තොරතුරු ද වැදගත් වන අතර ඉන් කවි කිහිපයක් පහත දැක්වේ.

"ධර්මරාජ ගල් පොත්තට වැඩලා
ධර්ම ආල කීර්තිය පෙන්නාලා
කර්ම කළෝ වත් එතැනට වැඩලා
ප්‍රේම පාපු ගල් පඩි කප්පාලා"

"ධර්මරාජයන් යස පරිසිද්දා
සේරු ඇතිව බිජු වපුල කෙතද්දා
බොරු නොම වෙයි මොක් සසර ගෙවද්දා
ධර්මරාජ ගල පසුකර - යද්දා"

(දිසානායක 2001 : 48)

පලාබත්ගල මාර්ගයේ ධර්මරාජගල පසුකර විට සීතගඟුල හමුවන අතර මිනිසුන් ස්නානය කොට පිරිසිදු භාවය ලබා ගන්නේ මෙම ස්ථානයේදී ය. ඉන් අනතුරුව හැරමිටිපාන හමුවන අතර එය ශ්‍රීපාදයට ගමන් කළ හැකි අතුරු මාර්ගයක් වූ කුරුවිට මාර්ගයයත්, දැරණියගල මාර්ගයත් පලාබත්ගල මාර්ගයට සම්බන්ධවන ස්ථානයයි. ශ්‍රීපාදයේ ඉහළ කොටස දුෂ්කර මාර්ගයක් වූ හෙයින් හැරමිටියක් ගෙන ගමන අරඹන නිසා හැරමිටිපාන නම් වූ බව සඳහන් වේ. ඉබන්බතුතාගේ වාර්තාවෙහි මෙම ස්ථානය "ඇලෙක්සැන්ඩර් රජුගේ කඳු ගැටය" ලෙස දක්වා ඇත. එයට හේතුව ග්‍රීක ජාතික ඇලෙක්සැන්ඩර් රජු ද ශ්‍රීපාදය වැඳපුදා ගත් බවට තිබෙන ඔවුන්ගේ විශ්වාසයයි. බ්‍රෝහියර් තම වාර්තාවේ හැරමිටිපානේ සිට මළුවට සැතපුම් 03 ක් බව දක්වා ඇත. (හේවාවසම් 1999 : 335) හැරමිටිපානෙන් පසුව පිවිසෙන්නේ 'ආඬියාමලතැන්න' වෙතය. සීතාවක රාජසිංහ රජු ශ්‍රීපාදස්ථානය බෞද්ධයන්ට අහිමි කොට හින්දුන්ට පැවරූ අතර හින්දු පූජකයකු වූ 'ආඬිගුරු' මෙම ස්ථානයේදී මිය ගිය නිසා 'ආඬියාමලතැන්න' වී තිබේ. (කරුණාදාස 2013 : 54) මෙම මාර්ගයේදී හමුවන ඇහැළකනුව තවත් සුවිශේෂී ස්ථානයකි. ශ්‍රීපාදය සඳහා මුක්කුවත්ත මාර්ගයෙන් එන බැතිමතුන් මේ ස්ථානයේදී පලාබත්ගල මාර්ගය හා සම්බන්ධ වේ. ඇහැළකනුවෙන් පසු ගමන් මාර්ගය අතිශය දුෂ්කර වන අතර එම ප්‍රදේශය ද. මහගිරිදඹය, අහස්ගව්ව, හුළංකපොල්ල ආදී නම් වලින් හැඳින්වේ. දම්වැල් ආධාරයෙන් මෙම කොටස තරණය කළ බවට තොරතුරු ඉබන්බතුතාගේ වාර්තාවෙන් ලැබේ. මහගිරිදඹය තරණය කිරීම සඳහා දම්වැල් 10 ක් යොදා තිබූ බවත්, එයින් 02ක් එකිනෙකට ළංව ද, තවත් 07 ක් එකිනෙකට ඈත්ව ද, අනෙක හුදෙකලාව ද පැවති බව ඔහු දක්වයි. හුදකලාව පැවති අන්තිම දම්වැල "සාක්ෂියෙහි දම්වැල" යනුවෙන් ඉබන්බතුතා දක්වා ඇත. (Defremery 1999.52 ) එසේ හැඳින්වීමට හේතුව ජීවිතයත් මරණයක් අතර සාක්ෂිකරුවා බවට එම දම්වැල පත් වූ නිසා වන්නට ඇත. මහගිරිදඹය තරණය කිරීමෙන් පසුව බැතිමතුන් හට මළුවට ළඟාවීමට හැකියාව ලැබේ.

***මස්කෙළිය - නල්ලතන්නි මාර්ගය***

ශ්‍රීපාදය තරණය කිරීමට හැකි අනෙක් ප්‍රධාන මාර්ගය වන මෙය නුවරඑළිය මූලික කර ගනිමින් සමනොළගිර තරණය කරන බැතිමතුන්හට බෙහෙවින් උපකාරී වේ. දේශීය සාහිත්‍ය මූලාශ්‍රයවලට අනුව මෙම මාර්ගය "කදලිගාම මග්ග' යනුවෙන් හඳුන්වා ඇත. (මහාවංශය, ද්විතීයභාගය 1996 : 06 ගාථාව) අතීතයේදී මේ මාර්ගය රජරට සිට නුවර, ගම්පොළ, අඹගමුව ඔස්සේ සමන්ගිර කරා විහිදී තිබුණු බව එකී මූලාශ්‍රයේ සඳහන් වේ. ක්‍රි.ව. 1344 දී ලංකාවේ දේශ ගවේෂණය කළ ඉබන්බතුතා මේ මාර්ගය පිළිබඳ දක්වමින් ශ්‍රීපාදය වැඳ ගැනීම සඳහා පලාබද්ගල මාර්ගයත්, නැවත පැමිණීම සඳහා හැටන් මාර්ගය යොදා ගත් බවත් සිය කෘතිය තුළ දක්වා ඇත. බතුතාගේ වාර්තාවට අනුව ඔහු "බබා පාර" සහ "මමා පාර" යනුවෙන් මාර්ග දෙකක් ගැන සඳහන් කරන අතර ඒවාගේ පාර හෙවත් මමා පාර ලෙස නල්ලතන්නි මාර්ගය දක්වා තිබේ. (Defremery 1999 : 51) වර්තමානය වන විට මෙම සිරිපා මාර්ගය වඩා ප්‍රසිද්ධත්වයට පත්ව ඇත්තේ 'නල්ලතන්නි" මාර්ගය ලෙසය. "නල්ල" යනු හොඳ යන්නත් 'තන්නි' යනු වතුර යන්නත් දෙමළ බසින් අරුත් ගන්නා අතර සීතල දිය දහරාවන්ගෙන් යුත්

ගංගාවක් ගලා බසින නිසා නල්ලතන්නි ලෙස ව්‍යවහාර කොට ඇත. සිරිපා වාරය තුළ දී සමන් දෙවිරුව වඩම්මන මාර්ගය ද මෙය වේ.

"බ්‍රෝහියර් දුටු ලංකාව" නම් ග්‍රන්ථයේ මෙම මාර්ගය දුෂ්කර නොවූ ස්වභාව සෞන්දර්යයෙන් හෙබි මාර්ගයක් ලෙස දක්වා ඇත.

"මස්කෙලිය හරහා වැටී ඇති පළමු සඳහන් මාර්ගය ඔස්සේ යනවිට මුහුණපාන්නට සිදුවන අපහසුතා මඳ නිසාත් එම මාර්ගය අතින් ඒවාට වඩා කෙටි නිසාත් ඒ මාර්ගය ඔස්සේ ගමන් කිරීමට බොහෝ වන්දනාකරුවෝ ප්‍රියකරති. වඩා දුෂ්කර මාර්ගයේ ගියහොත් පින වැඩිවේවි යැයි විශ්වාස කරන සෙසු සැදැහැවත්හු අනෙක් මාර්ග තෝරා ගනිත්" (හේවාවසම් 1999 : 329)

මෙලෙස මූලාශ්‍රයන්හි හෙළිවන හැටන් මාර්ගයේ ගමන්ගත් දේශීය රජවරුන් පිළිබඳව ද තොරතුරු අනාවරණය වී තිබේ. පොළොන්නරු යුගයේදී විජයබාහු රජු තම ශ්‍රීපාද වන්දනාව සඳහා නල්ලතන්නි මාර්ගය යොදාගත් බවට අඹගමුව ශිලා ලිපිය සාක්ෂ්‍ය දරයි. ඔහු විසින් ශ්‍රීපාද වන්දනාව සඳහා බැතිමතුන් වෙනුවෙන් පූජා කළ ගම්වර පිළිබඳව එම ශිලා ලිපියෙන් තොරතුරු ලැබේ. එසේ පූජා කරන ලද ගමක් වශයෙන් කෙසෙල්ගම හඳුනාගෙන ඇත. (මහාවංශය, ද්විතීයභාගය 1996 : 66) මෙම කෙසෙල්ගම යනු හැටන් නගරයේ ආසන්න ගමක් බවත්, එය රජු විසින් ශ්‍රී පාද බැතිමතුන් වෙත පූජා කළ බව අඹගමුව ශිලාලිපියට අනුව පැහැදිලි වේ.

නිශ්ශංකමල්ල රජු ද මෙම මාර්ගය යොදා ගනිමින් චතුරංගනී සේනාවත් සමඟ සිරිපා වඳින්නට ගිය බව මහාවංශයේ සඳහන් වේ.

සේනාය චතුංගිත්‍ය සද්ධිං භක්ති පුරස්සරං

ගත්ත්වා සමන්තකූටං සො අභිවන්දිය භූපති" (මහාවංශය 1959 : 84)

මහාවංශයේ එන මෙම පුවත නිශ්ශංකමල්ල රජුගේ භගවාලෙන ශිලා ලිපියෙන් තහවුරු වී තිබේ. භගවාලෙන යනු නල්ලතන්නි මාර්ගයේ මළුවට මඳක් පහළින් පිහිටා ඇති ලෙනකි. මෙම ලෙනෙහි බිත්තියක රුවක් නෙළා ඇති අයුරු දැකගත හැකි අතර එය නිශ්ශංකමල්ල රජුගේ රුව බවට ඒ අසළ ඇති සෙල්ලිපිය සාක්ෂි දරයි.

"නිශ්ශං
ක පරාක්‍රමබා
හු චක්‍රවර්ති
ස්වාමින් වහන්
සේ පද ලසදා
වැඳ බැස සිටි
තියායි"

නල්ලතන්නි මාර්ගයෙන් ශ්‍රීපාදස්ථානයට පැමිණි විදේශිකයන් මෙන් ම සාමාන්‍ය ජනතාව ද බොහෝ වෙයි. "සමනල ගමනාලංකාරය හා ශ්‍රීපාද වන්දනාව" ඊට සාක්ෂ්‍ය සපයයි.

"සරණ තිලෝගුරු මුණි ගුණ සිහිකර අඳරින
සුරත වෙතට අයැද පඬුරු බැඳගෙන යසසින
එදින දයාදර සිතකින් කත සමගින
තුටින පැමිණියෙහි දුම්රියපළට රඹුක්කන"
"නෙතින් බලා එහි විසිතුරු සතුටු වුන
බලන් සොඳුරෙ මාවත විසිතුරු සොඳින
එදුම් රථය වේගෙන් ගොස් එම සඳින
හැටන් කියන ස්ටේසම ළඟා වුන" (සමනල ගමනාලංකාරය සහ ශ්‍රීපාද වන්දනාව 1924 : 2-4 පිටු)

මේ අනුව රඹුක්කන ආදී ප්‍රදේශවලින් ගිය ජනතාව දුම්රිය ඔස්සේ හැටන් වෙත ගමන් කළ අයුරු අවබෝධ කරගත හැකිය. පලාබත්ගල මාර්ගය හා සසඳන විට මෙම මාර්ගය කෙටිම මාර්ගය වීමත්, වැඩි පහසුකම් තිබීමත් මෙම මාර්ගය ජනප්‍රිය වීමට හේතු සාධකයක් ලෙසින් පෙන්වාදිය හැකිය.

**ශ්‍රීපාදස්ථානයට යොමු විය හැකි අතුරු මාවත්**

***කුරුවිට - එරත්න මාර්ගය***

සබරගමුව පළාතේ රත්නපුර දිස්ත්‍රික්කය පදනම් කරගෙන ශ්‍රීපාදය කරුණා කරන බැතිමතුන්හට ගමන් කළ හැකි අතුරු මාර්ගයකි. ඉතාමත් දුෂ්කර මාර්ගයක් වූ මෙම මර්ගය පිළිබඳව බ්‍රෝහියර් වාර්තාවේ ද සඳහන් කොට ඇත.

"වඩාත්ම ජනප්‍රිය මාර්ගය වන්නේ එරත්නේ සිට කුරුවිට එන මාර්ගයයි. මේ මාර්ගය සැතපුම් විසි දෙකක් පමණ දුරවේ. එමෙන්ම එය වෙහෙස කරන ගමනකි. කුරුවිටින් ආරම්භ වන මාර්ගය ඒ මේ අතට වක්‍රව ගමන් කරමින් කුරු ගඟ දිගේම එහි මුලාශ්‍රය දක්වාම දිවෙයි. මේ මාර්ගය වන වදුලු තුළින් රූස්ස ගස් අතරින් වේගයෙන් ගල ගංගා තරණය කරමින් බෝපත් හෙළ දිය ඇල්ලේ භීෂණ හඬ අසමින් අඩවිකන්ද දක්වා දිවෙයි" (හේවාවසම් 1999 : 339)

මේ අතුරු මාර්ගය තුළින් ගමන් කරනවිට අම්බලම් විශාල ප්‍රමාණයක් හමුවේ. ඩයිමන්ග ගල අම්බලම, ජම්බෝලගහයට අම්බලම, වර්ණගල අම්බලම ඒ අතරින් කිහිපයකි. මෙසේ අම්බලම් රාශියක් දැක ගැනීමට හැකියාව ලැබීමෙන් පෙනෙන්නේ එම මාර්ගයෙහි පවතින දුෂ්කරතාවයි. හැරමිටිපාන නම් ප්‍රදේශයේදී කුරුවිට - එරත්න මාර්ගය පලාබද්ගල මාර්ගයට සම්බන්ධවනු දැකිය හැකිය.

***දැරණියගල - මාලිබොඩ මාර්ගය***

සබරගමුව පළාතේ කෑගල්ල දිස්ත්‍රික්කය ප්‍රධාන කර ගනිමින් වැටී ඇති අතුරු මාර්ගයකි. උඩ මාලිබොඩ, අංහෙට්ටිගම ආදි බොහෝ ගම් රාශියක ජනතාව අතීතයේ මෙන්ම අදටත් මෙම මාර්ගය භාවිත කරමින් සිරිපා වන්දනාවේ යෙදෙයි. මෙසේ බොහෝ දෙනෙක් මෙම මාර්ග භාවිත කළත් හැටන් හා පලාබද්ගල මාර්ගයන්ට සාපේක්ෂව අතිශයින් දුෂ්කර එකකි. දැරණියගල සුමන සමන් දේවාලයෙන් ගමන් ආරම්භ කළ පසු බැතිමතුන් ලස්සේගම පසුකර යන විට නක්කාවිට නාලන්දා පුරාණ රජමහා විහාරය හමුවේ. මෙම විහාරයට අමතරව තවත් විහාරාරාම රැසක් මෙම මාර්ගයේදී හමුවන අතර පුවක්මල් ඇල්ල පන්සල, අංහෙට්ටිගම රජමහා විහාරය ඉන් සමහරකි. බෞද්ධ විහාරාරාම පමණක් නොව ද්‍රවිඩ ජනතාවගේ කෝවිල් මෙම මාර්ගයේදී හමුවීම සුවිශේෂිතාවකි. ඉරුගල් බණ්ඩාර කෝවිල ඉන් ප්‍රධාන වේ. එමගින් පැහැදිලි වන්නේ සිංහල බැතිමතුන් පමණක් නොව දෙමළ ජනයා ද වැඩි වශයෙන් මෙම මාර්ගය භාවිත කළ බවකි.

***මුක්කුවත්ත මාර්ගය***

ශ්‍රීපාදස්ථානය තරණය කිරීම සඳහා යොදාගන්නා තවත් කෙටි මාර්ගයක් වන්නේ මුක්කුවත්ත මාර්ගයයි. මෙම මාර්ගය බොහෝ දුරට රත්නපුර හා බලංගොඩ ප්‍රදේශ ආශ්‍රිතව වාසය කරන මිනිසුන් අතර ජනප්‍රිය මාර්ගයක්ව පවතී. රත්නපුර ප්‍රදේශය හරහා මෙම අතුරු මාර්ගය වැටී ඇති අතර එම ප්‍රදේශ ආශ්‍රිත මිනිසුන් මේ මාර්ගය වැඩි වශයෙන් භාවිත කරන්නට හේතු වී ඇත්තේ පලාබද්ගල හා එරත්න වැනි මාර්ගයක් දැඩි දුෂ්කර මාර්ගයන් වීමත්, එම මාර්ග හා සන්සන්දනය කරන විට මෙම මාර්ගය ද දුෂ්කර මාර්ගයක් වුවත් සිරිපා මළුවට ඇති දුර ප්‍රමාණය අඩුවීම නිසා බැතිමතුන් අතර ජනප්‍රිය වන්නට හේතුවක් වී ඇත.

මෙම මාර්ගවලට අමතරව නුවරඑළිය දිස්ත්‍රික්කයේ පදනම් කරමින් පිහිටි අතුරු සිරිපා මාර්ගයක් වූ මරේවත්ත හෙවත් රාජමලේ මාර්ගය ද වැදගත් වේ. නුවරඑළිය දිස්ත්‍රික්කය මුල් කර ගනිමින් වැටී ඇති ගවරවිල මාර්ගය ද සුවිශේෂී එකකි. ගවරුන් මෙම ප්‍රදේශය ආශ්‍රිතව වාසය කළ නිසා එම නම මෙම

මාර්ගයට ලැබුණු බවට මතයකි. ඌව රටේ සහ රුහුණු රටේ පැරණි ජනතාව මෙම මාර්ගය භාවිත කර තිබේ.

**සමාලෝචනය**

පුරාණ ශ්‍රී ලංකාවේ ශ්‍රීපාද කන්ද තෙක් විහිදුණු ගමන් මාර්ග රැසක් පුරාතනයේ සිටම පැවතිණි. එයින් ප්‍රධාන මාර්ග ද්විත්වය ලෙස පලාබත්ගල මාර්ගය හා මස්කෙළිය නල්ලතන්නි මාර්ගය දැක්විය හැකිය. මෙම මාර්ග දෙකට අමතරව තවත් අතුරු මාර්ග රැසක් පුරාණයේ සිටම පැවතී ඇති අතර එම සියලු මාර්ග අතරමගදී ප්‍රධාන මාර්ගවලට සම්බන්ධ වෙමින් සංවිධානාත්මක මාර්ග රටාවක් නිර්මාණය වී පැවති බව පැහැදිලිය. රාජකීයයන්, විදේශියයන් මෙන්ම සාමාන්‍ය ජනතාව ද මෙම මාර්ග සිරිපා තරණය සඳහා උපයෝගී කරගෙන තිබේ. එහෙත් වර්තමානය වන විට ප්‍රධාන මාර්ග හැරුණුකොට සිරිපා තරණය උදෙසා අතුරු මාර්ග භාවිතා කිරීමේ ප්‍රවනතාවයෙහි අඩුවක් දැකිය හැකිය.

**ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය**

***ප්‍රාථමික මූලාශ්‍රය***

ඩේවි දුටු ලංකාව, 1967, තෙන්නකෝන් විමලානන්ද (සංස්) ඇම්.ඩී.ගුණසේන සහ සමාගම

බ්‍රෝහියර් දුටු ලංකාව, 1999, අභය හේවාවසම් (සංස්) සූරිය ප්‍රකාශකයෝ, කොළඹ.

මහාවංශය (දෙවන කොටස) 1996, ශ්‍රී සුමංගල හිමි හා බටුවන්තුඩාවේ දේවරක්ෂිත (සංස්), එස් ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ.

සමනල ගමනාලංකාරය හා ශ්‍රී පාද වන්දනාව, 1924, පී.ඇම් විද්‍යා කලාප යන්ත්‍රාලය, කෑගල්ල

***ද්විතියික මූලාශ්‍රය***

ඤාණවිමල හිමි කිරි ඇල්ලේ, 1942, සබරගමුවේ පැරණි ලියවිලි, මානව හිතවාදී ලේඛක පර්ෂදය, නුගේගොඩ.

රූපසිංහ කරුණාදාස, 2007, ශ්‍රී පාද වන්දනා සාහිත්‍ය, ඇස් ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ.

හේමපාල නුවරඑළියේ 2005, සිරිලක සිරි විදෙස් ඇසින්, විජේසූරිය ග්‍රන්ථ කේන්ද්‍රය, මුල්ලේරියාව

Ibn Bathuta in the Maldives and Ceylon, 1999, MM Defremery and Sanguinetto (Translated) Asian Educational Services, New Delhi